www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ජනාධිපතිවරනයේ ජාත්‍යන්තර වැදගත්කම

## The international significance of the Sri Lankan presidential election

2015 ජනවාරි 7

මූලික කරුනු දෙකක් සම්බන්ධයෙන්, ජනවාරි 08දා පැවැත්වෙන ජනාධිපතිවරනය, ජාත්‍යන්තර කම්කරු පන්තියට වැදගත් වේ.

පලමුවෙන්, ජනාධිපති මහින්ද රාජපක්ෂ ඉවත් කිරීම සඳහා වොෂින්ටනය, තිරය පිසුපස සිට මැතිවරනයට මැදිහත්වීම, ලොව පුරා ද ආසියාවේ ද සිය අරමුනු ඉටුකර ගැනීම පිනිස එක්සත් ජනපද අධිරාජ්‍යවාදය ගන්නා රුදුරු හා ඉවබව නැති පියවර පිලිබඳව කෙරෙන තියුනු අනතුරු ඇඟවීමකි. ගෝලීය ධනවාදයේ ගැඹුරු වන බිඳවැටීම හා වැඩෙන භූදේශපාලනික ආතතීන් හමුවේ, ඇමරිකාව සිය ප්‍රතිවාදීන්ට එරෙහිව යුද්ධයට සූදානම් වීමේදී කිසිදු අවහිරයක් නොඉවසනු ඇත.

දෙවනුව, සමාජවාදී සමානතා පක්ෂය (සසප) හා එහි ජනාධිපති අපේක්ෂක පානි විජේසිරිවර්ධන ගෙන ගිය උද්ඝෝෂනය, ශ්‍රී ලංකාවේ පමනක් නොව ආසියාවේ හා ලෝකය පුරා කම්කරු පන්තිය සඳහා ද මඟ පෙන්වයි. විපක්ෂයේ සියලු පක්ෂ, "ප්‍රජාතන්ත්‍රවාදී විකල්පය" ලෙස රාජපක්ෂගේ ධනපති ප්‍රතිවාදියා වන මෛත්‍රීපාල සිරිසේන පුම්බද්දී, සසප අවධාරනය කලේ, සමාජවාදී ජාත්‍යන්තරවාදයේ පදනම මත පාලක පන්තියේ සියලු කොටස්වලින් සිය දේශපාලන ස්වාධීනත්වය පිහිටුවා ගැනීමට සටන් වැදීම මගින් ම පමනක් කම්කරු පන්තියට යුද්ධයේ අන්තරාය පරාජය කල හැකි බව යි.

පටන්ගැනීමේ සිටම මැතිවරනය, දේශපාලනික අර්බුදයක් විය. රාජපක්ෂ වසර දෙකකට කලින් මැතිවරනය නිවේදනය කලේ, තමන්ට තෙවන වරටත් ඉදිරිපත්වීමට හැකියාව ලබාදෙන ව්‍යවස්ථා සංශෝධනයක් සම්මත කර ගැනීමෙන් ඉක්බිතිව ය. එය වනාහී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝග මත රාජපක්ෂ ගෙන යන කප්පාදු පිලිවෙත හා පොලිස්-රාජ්‍ය ක්‍රමෝපායන් කෙරෙහි නැගෙන විරුද්ධත්වය මෙන්ම, 2009දී අවසන්වූ බෙදුම්වාදී එල්ටීටීඊයට එරෙහි දිගු කලක් පැවති වර්ගවාදී යුද්ධයේදී මිලිටරිය සිදුකල යුද අපරාධ පිලිබඳව, ඔහුගේ ආන්ඩුවට එරෙහිව එක්සත් ජනපදයේ මූලිකත්වයෙන් යුත් "මානව අයිතීන්" ව්‍යාපාරය ද දැඩි වෙද්දී, රාජපක්ෂ තන්ත්‍රය ස්ථාවර කරගැනීමට දැරුනු මංමුලාසහගත උත්සාහයකි.

රාජපක්ෂ මැතිවරන දිනය ප්‍රකාශයට පත්කල වහාම ඇමරිකාව තම දේශපාලන උගුල ක්‍රියාත්මක කලේ ය. පාලක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) මහ ලේකම් හා ආන්ඩුවේ සෞඛ්‍ය ඇමතිව සිටි මෛත්‍රීපාල සිරිසේන, සිය තනතුරුවලින් ඉවත්වී, ඇමරිකානු ගැති එක්සත් ජාතික පක්ෂය (එජාප) සමග අත්වැල් බැඳගත් අතර තමා "විපක්ෂයේ පොදු අපේක්ෂකයා" ලෙස ඉදිරිපත්වන බව කියා සිටියේ ය. ව්‍යාපෘතිය මාස ගනනාවක නොවේ නම් සති ගනනාවක කුමන්ත්‍රනයක් වූ අතර එහි සෑම තැනම වොෂින්ටනයේ ඇඟිලි සලකුනු පැවතුනි. ශ්‍රීලනිපය තුල සැලකිය යුතු අනුග්‍රාහකත්වයක් සහිතව සිටි, හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග ක්‍රියාන්විතයේ ප්‍රමුඛ චරිතයක් වූ අතර, ඇය ක්ලින්ටන් පදනම හරහා වොෂින්ටනය හා ධවල මන්දිරය සමඟ සමීප සම්බන්ධතා පවත්වයි.

මිලිටරිමය වශයෙන් චීනයට වල කැපීම හා එරට වැටලීම අරමුනු කරගත් ජනාධිපති ඔබාමාගේ "ආසියාවට හැරීම" වේගවත් කිරීමත් සමග මැතිවරනය තුල ඇමරිකාවේ මැදිහත්වීම බැඳී ඇත. පසුගිය පස් වසර පුරාම ඇමරිකාව, සම්බාධක හා අපරාධ චෝදනා ඉදිරිපත් කිරීමට ඉඩ ඇති ජාත්‍යන්තර යුද අපරාධ පරීක්ෂනයක් ලෙලවමින් රාජපක්ෂට තර්ජනය කලේ ය. රාජපක්ෂගේ එල්ටීටීඊ විරෝධී යුද්ධයට මුලුමනින් ම පිටුබලය දුන් වොෂින්ටනය, ඔවුන් ලෝකය පුරා යලි යලිත් සිදුකර ඇති ආකාරයට, රාජපක්ෂ බීජිනයෙන් දුරස්ත කර තැබීම සඳහා ලීවරයක් ලෙස, "මානව අයිතීන්" පිලිබඳ සටන් පාඨය නරුම ලෙස ගසාකෑවේ ය.

කෙසේ වෙතත් 2014 සලකුනු කලේ, ගෝලීය ආර්ථික අර්බුදයේ හා අන්තර් සම්බන්ධිත භූ-දේශපාලනික ආතතීන් යන දෙකේම තියුනු වීමකි. ඇමරිකාව, යුක්රේනය මුල් කරගෙන රුසියාව සමග උග්‍රවන වන ගැටුමක් අවුලුවමින් හා මැද පෙරදිග නව යුද්ධයක් දියත් කරමින් ද ඕනෑම එකක් පුලුල් කලාපීය හා ගෝලීය යුද්ධ ඇවිලවීමක තර්ජනය මතු කරන අන්තරායකාරී ජ්වලන කේන්ද්‍ර නිර්මානය කරමින් ද චීනය මත පීඩනය දැඩි කරයි. මේ වසර ඇරඹුනේ, සෝනි සමාගමේ පරිගනක ජාලයන්ට හොරෙන් ඇතුලුවූ බවට ගොතන ලද චෝදනා මුල්කරගෙන උතුරු කොරියාවට එරෙහිව ගනන් බලා සිදුකරන ලද ඇමෙරිකානු ප්‍රකෝපකරනයන් සමගින් මෙන්ම මෙරට මැතිවරනය තුල අස්ථාවරකාරී මැදිහත්වීමක් ද සමගින් ය.

රාජපක්ෂ මත පීඩනය යෙදීම සඳහා ඔබාමා පාලනයට තවත් කල් මැරිය නොහැකි තතු හමුවේ, පාලන තන්ත්‍ර වෙනසක් සඳහා තීන්දු ගෙන ඇත. රාජ්‍ය ලේකම් ජෝන් කෙරීගේ සම කතෘත්වයෙන් 2009 නිකුත්කල සෙනේට් සභා වාර්තාව මෙසේ නිගමනය කර තිබුනි."එක්සත් ජනපදයට ශ්‍රී ලංකාව අහිමිකරගත නොහැකි ය." පසුගිය පස් වසර තුල, ඉන්දු-ශාන්තිකර කලාපය පුරා චීනයට එරෙහිව නාටකාකාර ඇමරිකානු

මිලිටරි තරකිරීම් හා සන්ධාන ශක්තිමත් කිරීම දැකගත හැකි විය. මෙරට මූලෝපායික වටිනාකම, දෙවන ලෝක යුද්ධය අවධියේ දී බ්‍රිතාන්‍ය අනදෙන මූලස්ථානය දිවයින තුල ස්ථාපනය කිරීමෙන් සලකුනු විය. පෙන්ටගනයේ යුද සැලසුම්කරුවන් සම්බන්ධයෙන් ගත් කල ශ්‍රී ලංකාවේ අවනතාභාවය කල්පමා වී වැඩි ය.

දිනන්නේ රාජපක්ෂ හෝ සිරිසේන වුව ද සෑම අතකින්ම දූෂනයෙන්, ඡන්ද මංකොල්ලයෙන් හා ප්‍රචන්ඩත්වයෙන් වෙලී ඇති මැතිවරනයේදී ඇමෙරිකාවේ මැදිහත්වීම මගින් කොලඹ පැනනැගී ඇති දේශපාලන අර්බුදය බෙහෙවින් උත්සන්න කර ඇත. 08දා ඡන්දය සඳහා අසාමාන්‍ය ආරක්ෂක පියවර ගෙන තිබේ. ඒ අතර 71,000ක පොලිස් බල ඇනි යෙදවීමක් හා 5,000ක කැරලි මර්දන විශේෂ කාර්ය බලකායක් යෙදවීම ද අඩංගු ය. සමස්ත මිලිටරියම සීරුවෙන් තබා ඇති අතර හදිසි අවස්ථාවකදී යොදාගැනීමට පොලිස්පති යටතේ රඳවා ඇත.

තමන් මැතිවරනයෙන් පරාජයට පත්වුවහොත් සාමකාමී ලෙස බලය පවරා දෙන බව රාජපක්ෂ බ්‍රිතාන්‍යයේ *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පතට පවසා ඇති නමුත් ඔහුට පිටුබලය දෙන සභාගය හෝ මිලිටරිය එසේ කරන බවට සහතිකයක් ඇත්තේ නැත. 2010 පැවති මැතිවරනය දිනීමෙන් පසුව රාජපක්ෂ, සිය ප්‍රධාන ප්‍රතිවාදියාවූ සරත් ෆොන්සේකා වහාම අත්අඩංගුවට ගෙන, ගොතන ලද චෝදනා මත නඩු විමසා සිරගත කලේ ය.

කෙසේ වෙතත්, 2015දී රාජපක්ෂ මුහුනදී සිටින්නේ ඊට වඩා විශාල බලවේගයකට ය. බලයේ එල්ලී සිටීමට රාජපක්ෂ දරනු ලබන ඕනෑම උත්සාහයක්, ඔහු මැතිවරනය නීත්‍යානුකූලව ජයගත්තේ වුව ද ඇමරිකාවේ පිටුබලය ලබන "වර්න විප්ලවයක" අවදානමට මුහුන දෙනු හැකි ය. සියලු සලකුනු එලැඹ තිබේ. *ෆිනෑන්ෂල් ටයිම්ස්* ලිපිය ඇඟවුම් කරන පරිදි, ජාත්‍යන්තර මාධ්‍යය, විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය මාධ්‍ය, දැනටමත් සිරිසේන නමැති "ප්‍රජාතන්ත්‍රවාදියාට" හුරේ දමන අතර "සොරකම් කල මැතිවරනයක්" ගැන ඉඟි කරයි. මෙරට තුල සියලු ප්‍රධාන විපක්ෂ කන්ඩායම් ද සමග පාලක සභාගයේ කොටස්, ජාත්‍යන්තර සුලඟ හමන අත ඉවකරමින් එකතුවූහ. විශ්ව විද්‍යාල ශාස්ත්‍රාලිකයින්, කලාකරුවන්, රාජ්‍ය නොවන සංවිධාන හා වෘත්තීය සමිති නිලධරයින් ඇතුලු මධ්‍යම පන්තික ලිබරලුන්ගේ මුලු සේනාවක්ම සිරිසේන වටේ ගාල්වී සිටිති.

අතිශයින්ම විසකුරු භූමිකාව ඉටු කරන්නේ ව්‍යාජ වාම සංවිධාන විසින් ය. ඊට, නව සමසමාජ පක්ෂය (නසසප), එක්සත් සමාජවාදී පක්ෂය (එසප) හා පෙරටුගාමී සමාජවාදී පක්ෂය (පෙසප) ඇතුලත් ය. තරයේම ප්‍රතිගාමීවූ පෙලගැසීමකට, ප්‍රජාතන්ත්‍රවාදී වෙස් මුහුනක් පින්තාරු කිරීම ඔවුහු කැමැත්තෙන්ම බාරගෙන සිටිති. මෑත මාසයක් වන තුරුම සිරිසේන, රජපක්ෂ ආන්ඩුවේ ප්‍රමුඛයෙකුව සිටිමින්, එහි සියලු අපරාධවල ගැලී සිටියේ ය. විපක්ෂයේ සියලු ප්‍රධාන පක්ෂ එල්ටීටීඊයට එරෙහි යුද්ධයට පිටුබලය දෙමින් මිලිටරි අපාරාධ යුක්තිකරනය කලේ ය. කප්පාදුවේ පිලිවෙත්වලට එරෙහි වන කම්කරු පන්තිය මැඩීම සඳහා රාජපක්ෂ කලාක් මෙන්, පොලිස් රාජ්‍ය පියවර ගැනීමට හා ඇමරිකානු මිලිටරිවාදයට සහයෝගය දැක්වීමට එම එක ද පක්ෂයක්වත් මොනම පැකිලීමක්වත් නොදක්වනු ඇත.

සසප මැතිවරන ව්‍යාපාරයේ දේශපාලන වැදගත්කම රැඳී ඇත්තේ මෙහි ය. මැතිවරනය කවුරු ජය ගත්ත ද වැඩෙන යුද තර්ජනය හා ගැඹුරු කෙරෙන කප්පාදු පිලිබඳව කම්කරුවන්ට හා තරුනයින්ට අනතුරු අඟවමින්, සමාජවාදී ඉදිරිදර්ශනයක පදනම මත කම්කරු පන්තිය ස්වාධීනව බලමුලු ගැන්වීමට සටන් කල එකම පක්ෂය එය යි. විප්ලවවාදී නායකත්වයක් අහිමිවීමේ ප්‍රතිපල වශයෙන් දැනටමත් කම්කරු පන්තිය, විශේෂයෙන්ම ඊජිප්තුවේදී ලත් බේදජනක අත්දැකීම් පවතී. 2011දී එරට මුබාරක් ආඥාදායකත්වයට එරෙහි සමාජ නැගිටීම්, ඇමරිකාවේ පිටුබලය සහිත නව මිලිටරි ජුන්ටාවක් සඳහා මඟ හෙලි කරමින් ධනපති තන්ත්‍ර පෙලක් පිටුපස දක්කන ලදි.

මෙරට මැතිවරනය පෙන්නුම් කරන්නේ, ජාතිකවාදය හා ධනේශ්වර ජාතික රාජ්‍යය පදනම් කරගත් ඉදිරිදර්ශන සියල්ලේම පරිපූර්න බංකොලොත්කම ය. සසප මැතිවරන ප්‍රකාශනය මෙසේ සඳහන් කලේය. "අධිරාජ්‍යවාදි යුද්ධයට හා කප්පාදු පිලිවෙත්වලට එරෙහි අරගලය එහි පරිමාවෙන්ම ගත්කල අනිවාර්යයෙන්ම ජාත්‍යන්තර ය. කොතරම් විශාල ද කුඩා ද යන්න නොතකා එක් ජාතියකගේ පදනම මත අධිරාජ්‍යවාදයේ හෝ ගෝලීය සංගතවල හා මූල්‍ය ආයතනවල කොල්ලකාරී පිලිවෙත්වලට විරුද්ධ වීම ඇත්ත වසයෙන්ම කල නොහැකිය."

යුද්ධය කරා වන අධිරාජ්‍යවාදයේ තල්ලුව උත්සන්න වන තතු තුල කලාපයේ හා ලෝකය පුරා කම්කරු පන්තියට මුහුනපාන්නට වන තත්වය පිලිබඳ පූර්ව ඇඟවුමක් මෙරට මැතිවරනයට ඇමෙරිකාවේ මැදිහත්වීම මගින් සලකුනු කරයි. එයට මුහුනදී පරාජය කල හැකි වන්නේ, සමාජ කාලකන්නිකමට හා යුද්ධයට මුල් වන ලාභ පද්ධතිය අහෝසි කිරීම අරමුනු කරගත්, ප්‍රධාන අධිරාජ්‍යවාදී මධ්‍යස්ථානයන්හි මෙන්ම ආසියාවේ හා ලෝකය පුරා කම්කරු පන්තියේ එක්සත් ව්‍යාපාරයක පදනම මත පමනකි. සසප සටන් වදින ඉදිරිදර්ශනය එය යි. සියලු කම්කරුවන්ගෙන් හා තරුනයින්ගෙන් අප ඉල්ලා සිටින්නේ, සසප ජනාධිපති අපේක්ෂකයාට ඡන්දය දෙන ලෙසත් ඊටත් වඩා, ඉදිරි කාලයේ දේශපාලන අරගලවලට මුහුනදීම සඳහා සසපට බැඳී එය ගොඩනගන ලෙසත් ය.

**විජේ ඩයස්**

© www.wsws.org